රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

Public Administration Circular

අංක
இல.
No. } 44 ✓

# රජය විසින් පවරාගන්නා ලද ආයතනවල තියුතු සේවකයින් සඳහා නව ප්‍රවේශක භාවය

# அரசாங்கத்தால் கையேற்கப்பட்ட நிறுவனங்களின் பணியாளர்க்காய புதிதாகச் சேர்ந்த நிலை

# New Entrant Status for Employees of Institutions taken over by the Government

ආයතන චක්‍රලේඛ මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series No. } 35

රජයේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

මිළ விலை Price : -/20 තැපැල් ගාස්තුව தபாற் செலவு Postage : -/15

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය—රජය විසින් පවරාගන්නා ලද ආයතනවල නියුතු සේවකයන් සඳහා නව ප්‍රවේශක භාවය

රජය විසින් පවරා ගන්නා ලද විවිධ වර්ගවල ආයතනයන්හි නියුතු සේවකයින්ට සැළකීමේදී ඒකාකාරී බවක් නොතිබීම කෙරෙහි රජයේ සැළකිල්ල යොමු කරන ලදුව සේවකයකු නියුතුව සිටින ආයතන රජයට පවරා ගැනීමෙන් අනතුරුව හෝ දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාවකට හෝ රජයේ අතිකුත් මණ්ඩලයකට අන්තර් ග්‍රහණය කිරීම නිසා එම සේවකයා නව ප්‍රවේශකයකු වශයෙන් සැළකීම අසාධාරණ බව තීරණය කර ඇත.

2. එම නිසා, 1956 සැප්තැම්බර් මස 24 වෙනි දිනට පෙර මෙම ආයතනයන්හි සේවයට බැඳී ඇති සේවකයන් මෙලෙස රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී රාජ්‍ය භාෂා කටයුතු සඳහා “ ආදි ප්‍රවේශකයන් ” ලෙස සැලකීමට රජය තීරණය කර ඇත.

3. මේ අනුව, එවැනි සේවකයන් ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කිරීම සඳහා, සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමේ පූර්ව අවශ්‍යතාවයෙන් නිදහස් වන අතරම ඔවුන්ට නියමිත වැටුප් වැඩිවීම් ලබා ගැන්මට හැකිවනු ඇත. මෙම පරීක්ෂණයන් ගෙන් සාමර්ථය නොලැබීම හේතුකොට ගෙන ස්ථිර නොකරන ලද්දවුන්, අන් සැම අයුරින්ම සුදුසුකම් ලබා ඇත්නම් (ඔවුන් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ දින සිට) තනතුරුවල ස්ථිර කළ යුතුය.

4. නියමිත කාල සීමාවන් තුළදී ඔවුන් විසින් සිංහල ප්‍රවීණතාව ලබා නොගැනීම නිසා නවතා ඇති ඔවුන්ගේ වැටුප් වැඩිවීම්, ඒවා අන් සැම අයුරින්ම උපයා තිබේ නම් දැන් ආපසු දිය හැක. එතකුදු වුවත් 1971 සැප්තැම්බර් 8 දිනට පෙරවූ කාලයට අදාල වැටුප් වැඩිවීම් සම්බන්ධයෙන් හිඟ මුදල් කිසිවක් නොගෙවිය යුතුය.

මෙයින් අදහස් කරන්නේ එකී සේවකයන්ගේ වැටුප් වැඩිවීම් සිංහල ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත්වීම නිසා නොනවත්වන ලද්දේ නම්, ඔවුන් පැමිණිය යුතුව තුබුණු වැටුප් පියවරෙහිම, සැප්තැම්බර් 8 වැනිදා සිට, ඔවුන් තබනු ලබන බවය. ඔවුන්ට වැටුප් වර්ධක සඳහා හිඟ මුදල් ගෙවනු ලබන්නේ සැප්තැම්බර් 8 වැනි දින සිට මිස ඊට කලින්වූ කිසියම් කාල සීමාවක් සඳහා නොවේ.

5. මෙම චක්‍රලේඛයේ නියමයන්, 1971 සැප්තැම්බර් 8 වැනි දින හෝ ඊට කලින්, (විශ්‍රාම ගැනීමෙන් හෝ වෙනයම් ආකාරයකින්) රජයේ සේවය අත්හලවුන්ට අදාල නොවේ.

6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

කේ 9905—11,008 (72/1)

7. මෙම චක්‍රලේඛයෙහි ඇතුළත් කරුණු, රජයේ දෙපාර්තමේන්තුවලට හෝ රජයේ සංස්ථා වලට හෝ, අනිකුත් ව්‍යවස්ථාපිත ආයතනයන්ට හෝ, අන්තර් ග්‍රහණය කර ඇති සියල්ලන්ටම, එම දෙපාර්තමේන්තුවල හෝ ආයතනවල හෝ ප්‍රධානීන් විසින් දැන්විය යුතු වේ.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7,
1972 ජනවාරි මස 11 දින.
අංකය: 2/9/156/37/4 (එච්).